00123

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙරපාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩසටහන **2017/2018**

අවසාන පරීක්ෂණය

EPC1234/ESC1134- භාෂා කුසලතා සංවර්ධනය

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2019.04.22 වේලාව - ප.ව.02.00 - ප.ව.04.00 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසින් තෝරාගත් ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. භාෂාවකින් ඉටුකරගත හැකි කාර්යයන් පහක් **(05)** ලියන්න.

02. **"සියුම්වාලක කුසලතා"** සංවර්ධනයට සුදුසු ක්‍රියාකාරකම් පහක් **(05)** නම් කරන්න.

03. ළමයින්ගේ සවන්දීමේ කුසලතා වර්ධනයට තෝරාගන්නා කතාවක තිබිය යුතු විශේෂ ලක්ෂණ හතරක් **(04)** ලියන්න.

04. **"දෘෂ්ඨි විභේදන කුසලතාව"** යනු කුමක්දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

05. පෙර පාසල් ළමයින්ගේ නිදහස් කතාබහ වර්ධනය සඳහා යෝග්‍ය මාතෘකා පහක් **(05)** ලියන්න.

06. "පෙරලිවීමේ කුසලතා" යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

07. සවන්දීමේ කුසලතා සංවර්ධනය නොවූ සිසුවෙකු තුළින් දැකිය හැකි ලක්ෂණ හතරක් **(04)** ලියන්න.

08. පෙරපාසල් අවධියේ ළමයින්ගේ කතාවෙහි දක්නට ලැබෙන දුර්වලතා හතරක් **(04)** ලියන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) ළමයින් තුළ සවන්දීමේ කුසලතා සංවර්ධනය කිරීම සඳහා යොදාගත හැකි එකිනෙකට වෙනස් ක්‍රියාකාරකම් හතරක් ලියන්න. (ලකුණු 04)

(ii) ඔබ එම එක් එක් ක්‍රියකාරකම් සංවිධානය කරන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(iii) එම ක්‍රියාකාරකම් මගින් **සවන්දීමේ කුසලතා** සංවර්ධනය වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

10. (i) ළමා කතන්දර ඇසුරු කරගෙන ළමයින්ගේ කථනය වර්ධනය කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) පෙරපාසල් ළමයින් තුළ කථන කුසලතාව සංවර්ධනය කිරීමේ ප්‍රායෝගික වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) පෙර පාසල්වියේ ළමයින් තුළ **"පෙර ලිවීමේ"** කුසලතාව සංවර්ධනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ළමයින් තුළ **"පෙර ලිවීමේ කුසලතා"** නිසි පරිදි සංවර්ධනය නොවීම ඔවුන්ගේ ඉදිරි අධ්‍යාපනයට බලපාන ආකාරය උදාහරණ ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) ළමයින්ගේ "භාෂා කුසලතා සංවර්ධනය" සඳහා සෙල්ලම් ක්‍රියාකාරකම් දායක කරගත හැකි ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) "ශ්‍රවණ විභේදනය, සවන්දීම හා කථනය යන කුසලතා එකිනෙක හා බැඳී පවතින ක්‍රියාවලියකි."
සුදුසු උදාහරණ ඉදිරිපත් කරමින් මෙම කියමන පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (i) සවන්දීමේ ප්‍රභේද තුනක් **(03)** නම් කරන්න. (ලකුණු 06)

(ii) නිවෙස් පරිසරය ළමයින්ගේ කතා කිරීමේ කුසලතා සංවර්ධනයට බලපාන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ළමයෙකුගේ භාෂා සංවර්ධනය කෙරෙහි බලපාන සාධක හයක් **(06)** ලියන්න. (ලකුණු 06)

හිමිකම් ඇවිරිණි.